

1

# ශ්‍රී පාදය වැන්දවූ හැටි

කිසියම් ජන කොට්ඨාසයක් අතර කලාන්තරයක් තිස්සේ කටින් කට පැවත එන කතාන්දර, කවි, පිරුළු, රූඩී ආදිය ජනශ්‍රැතිය ලෙස හැඳින්වෙයි. ජනශ්‍රැතියෙන් අදාළ ජන කොට්ඨාසයේ ලෝකය පිළිබඳ විශ්වාස සහ දැක්ම නිරූපණය වේ. එමෙන් ම ජන කොට්ඨාසයක ලේඛන ගත නොවූ ඉතිහාසය ජනශ්‍රැතියක ඇතුළත් විය හැකි ය. ඉතිහාස ග්‍රන්ථවල ඇතුළත් නොවන වැදගත් තොරතුරු ද ඇතැම් විට ජනශ්‍රැතියෙහි ගැබ් විය හැකි ය. ජන කතාව ජනශ්‍රැතියට අයත් සාහිත්‍යාංගයකි. ගැමි ජනයාගේ ජීවිතයේ ප්‍රකට වන සතුට, ශෝකය මෙන් ම ජීවිතයේ විවිධ සිද්ධි හා අවස්ථා වෙත ඔවුන් විසින් හෙළන ලද උපේක්ෂා සහගත දෘෂ්ටිය ද ජන කතාවල සියුම් ලෙස නිරූපණය වී ඇත. මෙහි එන ජන කතාව විශ්‍රාමික විදුහල්පතිවරයකු වූ ඩී. පී. වික්‍රමසිංහ මහතාගේ ‘මග දිගට ජන කතා’ කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි.

මල්ලැහැව ගමට දකුණු දෙසින් පිහිටියේ කොටගම නමැති ගමයි. එය ද ඉතා පුරාණ කාලයේ සිට වැදගත් පරම්පරාවන්ට වාසභූමි වූ සරුසාර ගමකි. මේ ගම් දෙකට මැදින් ගල්ඔය ගලා බසී. දෙහිගල කඳුවැටියේ මැද භාගයේ උල්පත්වලින් පටන් ගන්නා මේ ගල්ඔය හරස්කර සේනානායක සමුද්‍රය නමැති අතිවිශාල මහා වාපිය බඳින ලද්දේ මෑතක දී ය. ගල්ඔයේ උත්පත්ති ප්‍රදේශය අසලින් මේ ගංගාව වැදගන්නා ශාඛා ඔයවල්වල ජලයෙන් පෝෂිත කොටගම වෙල්යාය ඉතා විශාල ය. එමෙන් ම ඉතා සාරවත් ය. වෙල්ලස්සේ පිහිටි ගම්වලින් මධ්‍යස්ථ දේශගුණයෙන් හා දර්ශනීයත්වයෙන් ද ප්‍රධානත්වය දෙතොත් නිරායාසයෙන් ම එය කොටගමට ලැබෙනවා ඇත.

පෙර සිංහල රජුන් දවස (අහවල් රජුගේ කාලයේ යැයි ස්ථිරව කිය නොහැකි ය) මේ ගමෙහි ඉතා ධනවත් වූ ද වංශවත් වූ ද රදළ පවුලක් විය. ධනවත්කම අනුව කොටගම සිටාණෝ යන නම මේ රදලවරයාට ව්‍යවහාර විය. ඒ සිටාණන්ට හා සිටු දේවියටත් සිටියේ එක ම දියණියකි. වැඩිවියට පත් දියණිය ඉතා ගුණවත් නැණවත් රූපශෝභිනියක් වූවා ය. සුදුසු කල්හි ඇය සුදුසු කුල පුත්‍රයෙකුට විවාහ කර දුන්නෙන්, ඒ යුවළ මවුපියන් සමග ඒ සිටු මැඳුරෙහි ම වාසය කළෝ ය. කල්යාමෙන් පසු මහලු මවුපිය දෙදෙන කාලක්‍රියා කළෙන් ඔවුන්ට අයිති මුළු ධන සම්පත්තියෙහි ම පාලනය ඔවුන් වෙත පැවරිණි. ඉතා සමගි සම්පන්න ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගත කළ ඔවුනට පුතුන් තිදෙනකු ලැබිණි. වැඩිමහල් පුතා අටළොස්වියට පත් කල්හි, ඒ පියා ද ජීවතුන් අතරෙන් තුරන් විය. සිටුකුමරිය අධෛර්ය නොවී සිය විශාල ධනස්කන්ධය ද නැති වී යා නො දී ආරක්ෂා කරමින් පුතුන් තිදෙනා ද හදා වඩා ගත්තා ය.

සුදුසු කල්හි සිය පුතුනට ද සුදුසු අන්දමින් කුලකුමරියන් සොයා ආවාහ කරදුන් සිටු කුමරිය, පරලොව සඳහා නොයෙක් පින්කම්හි යෙදුණා ය. නිති පන්සිල් රැකීමත් පෝය අටසිල් රැකීමත් අසල වූ විහාරස්ථානයට දන් පැන් දීමත් දුගියන්ට ආධාර කිරීමත් ඕ නො කඩවා සිදු කළා ය. අනුරාධපුර, කතරගම ආදි දුර බැහැර ස්ථානවලට වන්දනාව පිණිස ගියා ය. මෙසේ පින් කරමින් සිටිය දී ස්වභාව ධර්මය පරිදි මහලු බවට පත්ව සිය උත්සාහයෙන් ඈත ගමන් යාමට බැරි තත්ත්වයට පත් වූවා ය. 'මම ලක්දිව බොහෝ විහාරස්ථාන වන්දනා කළෙමි. මට වන්දනා කර ගන්ට බැරි වූයේ ශ්‍රී පාද පද්මය පමණ යි. අහෝ! තරුණ කාලයේ එය කර ගන්ට බැරි විය. කෙසේ හෝ මැරෙන්ට පළමුව ශ්‍රී පාද පද්මය ද වැඳ ගත්තොත්, ප්‍රීතිමත් සිතින් අවසන් හුස්ම හෙළිය හැකි ය. එය කෙසේ හෝ කළ යුතු ම ය. මම එය මගේ පුතුන්ට කියා බලමි. යම් පුතෙක් මගේ ඒ අදහස ඉෂ්ට කළ හොත් ඔහුට මගේ මුළු වස්තුව ම පවරන්නෙමි'යි ඕ සිතුවා ය.

මෙසේ සිතූ සිටු දුව තම පුතුන් තිදෙනා කැඳවා "දරුවෙනි, මම ලංකාවේ බොහෝ වෙහෙර විහාර වන්දනා කළෙමි. මට වන්දනා කරන්ට බැරි වූයේ ශ්‍රී පාද පද්මය පමණ යි. ඒ නිසා ඔබ තිදෙනාගෙන් යමෙකු මා ශ්‍රී පාදස්ථානයට ගෙන ගොස් වන්දනා කරවුව හොත් මගේ මුළු

වස්තුව ඔහුට පවරන්නෙමි''යි කීවා ය. එබස් ඇසූ වැඩිමහල් පුත්තු දෙන්නා ම ''අනේ අම්මේ, ඔබේ දැන් තත්ත්වය හැටියට කෙසේ ශ්‍රී පාද ගමන කළ හැකි ද? එය පිහිටියේ කොතරම් දුර ද? කොතරම් උස පර්වතයක් මුදුනේ ද? දැන් අම්මාගේ තත්ත්වයේ හැටියට කිසි සේත් එය කළ නොහැකි යි. එබැවින් එය සිතින් අස් කර ගත මැනව''යි කීවෝ ය. ඒ අසා සිටි බාල පුත්‍රයා 'අම්මාට ශ්‍රී පාදය වන්දනා කරගන්ට බැරි වුවොත් ඒ ගැන කලකිරුණු සිතින් ම ලෙඩ වී ඉක්මනින් මිය යාමට ද පුළුවනි. එහෙත් එවැනි දුෂ්කර ගමනක් අම්මා සමග යාමට ද නුපුළුවන. ගියොත් ආපසු එන්ට ලැබේ යයි සිතිය නොහැකි ය. ඒ නිසා මම දවස් කීපයකින් යා හැකි ශ්‍රී පාදය වැනි කන්දක් සොයා ඒ මත ශ්‍රී පාද ලාංඡනයක් කොටවා අම්මා කැඳවාගෙන ගොස් වන්දවා ඇගේ සිතේ ආසාව පසිඳලමී''යි සිතුවේ ය. ''මෑණියනි, මම ඔබ ශ්‍රී පාදයට කැඳවාගෙන යමි. නමුත් ඊට පෙර, එහි යාමට සුදුසු ගමන් මාර්ගය ආදිය දැනගත යුතු ය. මා එය දැනගෙන එන තුරු සතුටින් සිටිනු මැනව''යි පවසා විශාල ධන සම්භාරයකුත් රැගෙන ඉතා විශ්වාස කීප දෙනෙකුත් වුවමනා උපකරණත් රැගෙන එවැනි කන්දක් සොයමින් ඇවිද්දේ ය.

උස් කඳු ප්‍රදේශය පිහිටියේ තම ගමෙන් දකුණු දෙස බැවින් ඒ දෙසට ගමන් කළ ඔවුහු බදුලු පුරයට පැමිණියෝ ය. ඉනුත් දකුණු දෙසට දික්වැල්ල නාවුල්ල ආදි ගම් පසු කර පුරාණයේ දී ඒ කඳුකර ප්‍රදේශයෙන් ගුත්හල් මඩුල්ලට වැටී තිබූ දුර්ග මාර්ගය පටන්ගන්නා වූ ද, මාගම් පත්තුවෙන් සමුද්‍රය වැලඳගන්නා කිරිඳිඹයේ උත්පත්ති ප්‍රදේශය වන බඹරගම පසු කොට ඇද හැළෙන රාවණා ඇල්ල යයි ප්‍රසිද්ධ ස්ථානය අසල වූ ද රාවණා රජු විසුවේ යයි කටකතා අනුව පවතිනා ගිරිගුහාව පසෙකින් වූ ද උස් වූ පර්වත ශිඛරයක් දැක සුදුසු ස්ථානයක් ලද්දේ යයි සතුටුව ඒ අසල තාවකාලික පැලක් සාදා එහි නතර වූවෝ ය. සිටු කුමාරයා ගල් වඩුවන් ලවා ඒ ගිරි ශිඛරයට නැගීමට පඩි පෙළක් ද, ශිඛරය මුදුනේ ගල මත ශ්‍රී පාද ලාංඡනයක් ද කෙටවූවේ ය. එසේ ම ශ්‍රී පාද ස්ථානයේ ඇති සමන් දෙවොල මෙන් දේවාලයක් ද, දොළොස් මහේ පහනක් ද ඝණ්ටාරයක් ද වට කර ප්‍රාකාරයක් ද ඉතා ඉක්මනින් ගොඩනගා සියල්ල සම්පූර්ණ කර පිරිවර සමග ආපසු ගමට පැමිණියේ ය.

ඉක්බිති සිටු කුමරා ''මෑණියනි, මම ශ්‍රී පාද ස්ථානයට යන ගමන් මාර්ගය හා යා යුතු විධිය ද දැනගෙන ආවෙමි. ඒ නිසා ශ්‍රී පාද වන්දනාවට යාම පිණිස සූදානම් වනු මැනවැ''යි දන්වා සිටියේ ය. සිටු මාතාව ඉතාමත් ප්‍රීතියට පත්ව, පූජාවට අවශ්‍ය සියලු උපකරණ වහා ම සකස් කරවාගෙන තමාට උපස්ථානය සඳහා හිතවත් දැස්සන් කීපදෙනකු ද ගමනට නිල කරවාගෙන තමා ගමනට සූදානම් බව පුත්‍රයාට දැන්වූවා ය. සිටු කුමරා ද, ගමනට සුදුසු වේලාවක් සූදානම් කර ගෙන, ගෙන යාම සඳහා අවශ්‍ය දෝලා ගෙන, ප්‍රමාණ වන පිරිස ද රැස් කර ගෙන ඒ ගෙනයාම සඳහා අවශ්‍ය ආහාර, බෙහෙත් ආදි උපකරණ ඒවා ගෙන යාමට පිරිස ද එක්රැස් කරගෙන සුබ නැකතින් මෑණියන් පෙරදැරි කර ගෙන වන්දනා ගමනට පිටත් විය. ඔවුහු තැනිතලා ප්‍රදේශය පසු කර කඳුකර පර්වත භූමිකාවට නැග ඒ ඒ ස්ථානයන්හි ලැගුම් ගනිමින් ක්‍රමයෙන් ගොස් සති දෙකක දී පමණ බදුලු

පුරවරයට පැමිණියෝ ය. ''මෑණියනි, අප මේ පැමිණියේ සමන්තකූට පර්වතය අසල පිහිටි රත්නපුර නගරයට ය. ගමනේ දුෂ්කර කොටස ඇත්තේ ඉදිරියට ය. සමන් දෙවියන්ගේ කරුණාවෙන් අපට තව දවස් කීපයකින් ශ්‍රී පාද පද්මය දැක වැඳ පුදා ගන්නට හැකි වේ යයි සිටු කුමාරයා කීවේ ය.

බදුලු පුරයෙන් පිටත් වූ ඔවුහු අතරමග නොයෙක් ස්ථානවල නැවතී ගිමන් හරිමින් ගොස් රාවණා ඇල්ල සමීපයෙහි වූ කඳු කපොල්ලට පැමිණියෝ ය. ''මෑණියනි, මේ සීත ගඟුලයැ''යි කියා රාවණා ඇල්ල සමීපයෙන් ජලස්නානය කරවා පිරුවට අඳවා දෝලාවෙන් ම මෑණියන් කඳු ශිඛරයට කැඳවාගෙන ගියේ ය. ''මෑණියනි, මේ ශ්‍රී පාද පද්මය යි. මේ සමන් දේවාලය යි. මේ පෙනෙන්නේ දොළොස්මහ පාන යි. අර තිබෙන්නේ සණ්ටාරය යි'' ආදි වශයෙන් පෙන්වා දී, ''සිත් සේ වැඳ පුදා ගනු මැනවැ''යි කී කුමාරයා රාත්‍රී වාසය පිණිස ස්ථානයක් වැඩකරුවන් ලවා පිළියෙල කරවී ය. ශ්‍රද්ධාවෙන් ඉපිල ගිය සිටු මාතාව ගෙන ගිය පූජා භාණ්ඩ පුද කර සිත් සේ වැඳ පුදා ගත්තා ය. එදින කඳු ශිඛරයෙහි ම ගත කළ ඔවුහු පාන්දර සූර්යෝදය සමග වන ඉර සේවය ද බලා යහතින් කන්දෙන් පහළ බැස ක්‍රමයෙන් මග ගෙවා සිය ගමට පැමිණියෝ ය.

ශ්‍රී පාද වන්දනාවෙන් පසු ප්‍රීතියට පත් වූ සිටු මාතාව තමා සන්තකව පැවති සියලු වස්තුව පොරොන්දු ප්‍රකාර බාල පුතාට පැවරුවා ය. මවකගේ සන්තානයෙහි පවතින දාරක ප්‍රේමයෙහි බලමහිමය මෙතැන දී ඇයගේ සිත්හි බලපවත්වන්නට විය. ඕ බාල පුතාට කතා කර, ''පුතණුවනි, මා සිතෙහි බල පැවැත්වූ ඒ වන්දනා ගමන ඔබ ඉටු කළ නිසාත්, මා ඒ ගැන පොරොන්දුවක් වූ නිසාත් මගේ මුළු වස්තුව ම ඔබට පැවැරුයෙමි. එහෙත්, ඉතිරි දරුවන් දෙදෙනා කෙසේ ජීවත් වේ ද? ඔවුන්ට යන කලදසාව කිම? මගේ ඒ ආශාව ඉටු කළා සේ ම ඔබ දැන් මගේ සිතේ ශෝකය ද දුරු කළොත් මට ඉතා සන්තෝෂයෙන් අන්තිම ගමන යා හැකි ය. එය ද කළ හැකි වන්නේ ඔබට පමණ යි'' යැයි කීවා ය.

යුතුකම් දන්නා වූ ද, උණු වන හෘදයක් ඇත්තා වූ ද ඒ සිටු පුත්‍රයා ''මෑණියනි, ඔබගේ ශෝකය දුරු කරවා ගත මැනව. මම මගේ වැඩිමහල් සහෝදරයන් දෙදෙනා මගට බැස්සීමට සතුටු නො වෙමි. ඔබ නො කීවත් මා බලාපොරොත්තු වූයේ මගේ සහෝදරයන්ට මා ලත් වස්තුව බෙදා දීමට ය. එබැවින් සිත පහදා ගත මැනව. අද ම මගේ සහෝදරයන් දෙදෙනාට මා ලත් වස්තුව බෙදා දෙමි''යි කියා සහෝදරයන් දෙදෙනා කැඳවා මෑණියන් ඉදිරිපිට දී ම තමා ලත් වස්තු සම්භාරය තුනට බෙදා දෙකොටසක් තම සහෝදරයන් දෙදෙනාට පැවරුවේ ය. එයින් ප්‍රීතියට පත් මහලු සිටු දේවිය ''පුත, ඔබ බෝසත්වරයෙකි. ඔබට බුදුබව ලැබේවා! යි ප්‍රාර්ථනා කරමි. දැන් ඉතින් මට ප්‍රීතියෙන් මගේ අවසන් ගමන යා හැකි ය''යි කීවා ය. ඉන් ටික කලකට පසු ඕ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියා ය. සහෝදරයෝ තිදෙන සමගියෙන් ජීවත්ව ඉඳ, මහලු විය පත්ව පරලෝක ප්‍රාප්ත වූවෝ ය.

## අවබෝධය

1. තම මවට ශ්‍රී පාදය වැන්දවීමට බාල පුතා යොදා ගත් උපක්‍රමය විස්තර කරන්න.
2. මේ සිටු පුත්‍රයා ගුණ යහපත්කමින් පරිපූර්ණ අයකු බව ප්‍රකට වන්නේ කවර කරුණු නිසා ද?
3. ජන කතා පිළිබඳ ඔබේ අදහස වාක්‍ය තුනකින් පමණ ලියන්න.
4. මෙම ජන කතාවේ ඔබ සිත් ගත් අවස්ථා 2ක් ලියන්න.



# සිංහල භාෂාවේ රසවත් යෙදුම්

ලිවීමේ දී අදහස් වඩා රසවත් ආකාරයෙන් ප්‍රකාශ කිරීමට විශේෂ යෙදුම් උපකාරී වේ. සිංහල භාෂාවේ ප්‍රකාශන ශක්තිය ප්‍රකට කරන සාම්ප්‍රදායික යෙදුම් භාෂාව අලංකාර කිරීම සඳහා යොදා ගෙන ඇත. මේ යෙදුම් ඇසුරෙන් වාක්‍යවල අර්ථය වඩාත් තීව්‍ර ලෙස පැහැදිලි කොට ප්‍රකාශ කළ හැකි ය.

සිංහල වාක් සම්ප්‍රදායේ ප්‍රධාන අංග කීපයක් ලෙස ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ හා රුඪී හඳුන්වා දිය හැකි ය.

## ප්‍රස්තාව පිරුළු

අවස්ථාවට උචිත කියමන, නැති නම් තැනට සුදුසු කියමන බඳු අදහසක් මේ යෙදුම් විශේෂයෙන් මතු කර දක්වයි. බොහෝ විට මේවා පබැඳී ඇත්තේ, කිසියම් කතාවක් හෝ සිදුවීමක් මුල් කොට ගෙන ය. එසේ ම කිසියම් සත්‍යතාවක් හෝ සමාන බවක් හෝ මුල් කර ගත් පිරුළු ද ඇත. ලු, සේ, මෙන්, වැනි, වගේ නිපාතවලින් බොහෝ විට මේවා කෙළවර වී තිබෙනු දැකිය හැකි ය. මුඛ පරම්පරාගතව ඉදිරියට ගෙන ආ පොදු ජනතාවගේ ව්‍යවහාර භාෂාවේ පොහොසත්කම පෙන්වා දීමට ප්‍රස්තාව පිරුළු කදිම නිදසුනකි.

උදාහරණ:- කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා සේ

උණ පුරුකේ දැම්මත් බලු වලිගයේ ඇද නෑරේ

කණ කොකාගේ සුද පෙනෙන්නේ ඉගිළෙන විට ලු

ගල හොඳ නම් අඹරන කහ මක් වේ ද?

පය බරවායට පිටි කර බෙහෙත් බැන්දා වගෙයි

## ආප්තෝපදේශ

'ආප්ත' යනුවෙන් අදහස් කෙරෙනුයේ දැනුමැති, ඇසූ පිරූ තැන් ඇති, වියත් යන්න යි. ඒ නිසා බහුශ්‍රැතයන් විසින් දෙනු ලබන උපදෙස් හෝ අවවාද 'ආප්තෝපදේශ' (ආප්ත + උපදේශ) වශයෙන් හඳුන්වා දිය හැකි ය. සැඟවුණු අරුතින් හෝ ව්‍යංග්‍යාර්ථයෙන් තොරව ඍජුව ම කිසියම් උපදෙසක් ලබා දීම ආප්තෝපදේශවල ස්වභාවය යි.

උදාහරණ :- ඔවා දෙනු පර හට - තමා සම්මතයෙහි පිහිටා සිට

-ලෝකෝපකාරය-

ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන වැට බඳිනු
තමන්ගේ තරම දැනගෙන කල් අරිනු

-ජනකවි-

අඟුරු කිරෙන් සේදුවත් සුදු නො වේ

උගත මනා ශිල්පයමයි මතු රැකෙනා

හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ

අවි ගත්තෝ අවියෙන් ම නසිති

පිරුණු කළේ දිය නො සැලේ

## රෑඩී

භාවිත කෙරෙන වචනවල ප්‍රකටව පෙනෙන අර්ථවලට ඉඳුරා ම වෙනස් අර්ථයක් ධ්වනිත වන ලෙස යොදන භාෂාත්මක යෙදුම් රූඩී නම් වේ. පුළුල් අදහසක් වචන කීපයකින් හකුළා තීව්‍රව අර්ථවත්ව ප්‍රකාශ කිරීම රූඩීවල විශේෂ ලක්ෂණය යි. ඉඟි වැකි ලෙස ද හඳුන්වන්නේ රූඩී ම ය. වචනවලට ආරූඪ අර්ථයක් යෙදීම ලෙසින් ද මෙය හඳුන්වා දිය හැකි ය. වාක්‍යයක අර්ථය තීව්‍ර කිරීමට මෙන් ම රසවත් කිරීමට ද රූඩී උපකාරී වෙයි. රූඩී හා ප්‍රස්තාව පිරුළු අතර තරමක සමානකමක් දැකිය හැකි වුවත්, සංක්ෂිප්ත බව හා ව්‍යංග්‍යාර්ථවත් බව හේතුවෙන් රූඩී වෙන් කොට හඳුනා ගැනීම පහසු වෙයි.

උදාහරණ:- උගුරට හොරා බෙත් කැවා

මූණේ දැලි ගෑවා

ගොළුබෙලි ගමන

ඇගේ ලේ වතුර වුණා

කජු කන්නා වගේ

## ලිඛිත අභ්‍යාස

1. **ගැළපෙන රූඪී වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

    i. මැණිකක් ලැබුණු පසු ඔහුගේ ............ වගෙයි.
    ii. ගෙදරින් ලිපියක් ලැබෙන තුරු ............ මාධවන්ගේ සිරිත යි.
    iii. ඔහු මගේ දියුණුවට ........... සේ මට හැඟේ.
    iv. සුමතිපාල ........... බව මාමා කීවේ ය.
    v. ............ සිටියත්, දුකේ දී හැරයන්නෝ මිතුරෝ නො වෙති.

(දිවෙන් දිව ගාගෙන, ඇඟිලි ගැනීම, කරල පැහිලා, දිව දෙකේ මිනිසකු, අකුල් හෙළනවා)

2. **I කොටසේ අරුත්වලට ගැළපෙන රූඪී II කොටසින් තෝරන්න.**

| I කොටස | II කොටස |
|---|---|
| කරදර පිට කරදර | වැල්වටාරම් |
| ආදායම පහත වැටීම | කොරේ පිටට මරේ |
| ගෞරවය නැතිව යෑම | බහින කලාව |
| සුදන වෙස් ගත් දුදනා | උපාසක බළලා |
| අනවශ්‍ය විස්තර කීම | සායම යනවා |

## ප්‍රායෝගික අභ්‍යාස

1. **මේ ජන කතාව ඔබ කැමැති වෙනත් ආකාරයකින් ගොඩ නගා ඉදිරිපත් කරන්න.**
2. **පහත දක්වා ඇති පිරුළු ඇති වීමට පාදක වූ කතා පුවත් විමසන්න.**

    i. ගමරාලගේ වංගෙඩිය වගේ
    ii. බළලුන් ලවා කොස් ඇට බැව්වා වගේ
    iii. ලැජ්ජා නැතිකම මහමුදලිකමටත් වඩා ලොකු යි
    iv. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
    v. බල්ලගේ වැඩේ බූරුවා බාරගත්තා වගේ